// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2267/13 - 2022 පෙබරවාරි මස 15 වැනි අඟහරුවාදා - 2022.02.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත**

46 වන වගන්තියෙහි 1 වන උප වගන්තිය යටතේ නිකුත් කෙරෙන නියෝගය

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධිත) පනතේ 46 වන වගන්තියේ 1 වන උප වගන්තිය යටතේ පැවරෙන බලතල අනුව ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් මෙහි පහත සඳහන් උපලේඛනයේ II තීරුවේ දක්වා ඇති ආකාරයට එම උප ලේඛනයේ I තීරුවේ සඳහන් පරිදි අදාළ බලපත්‍ර හිමි බලපත්‍රලාභීන්ගෙන් අයකර ගනු ලැබීම පිණිස වාර්ෂික බද්දක් පනවනු ලබයි. මෙයට පෙර පලකරන ලද 2021 අප්‍රේල් 23 වැනි දින අංක 2224/47 දරන *ගැසට්* නිවේදනය මෙයින් අවලංගු කෙරේ.

සභාපති,
ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව.

6 වන මහල,
ලංකා බැංකු වෙළෙඳ කුළුණ,
අංක 28, සාන්ත මයිකල් පාර,
කොළඹ 03,
2022 පෙබරවාරි මස 14 වැනි දින.

1A - PG 5750 — 13 (2022/02)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**උපලේඛනය**

| *I තීරුව*<br>*බලපත්‍රය* | *II තීරුව*<br>*වාර්ෂික බද්ද* |
|---|---|
| ජනන බලපත්‍රය<br>සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති<br><br>සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති නොවන වෙනත් ජනන තාක්ෂණ | සත්‍ය ස්ථාපිත ධාරිතාවය මෙගා වොට් 1 ට රුපියල් 18,600.00<br><br>ස්ථාපිත ධාරිතාවය මෙගා වොට් 1ට හෝ ඉන් කොටසකට රුපියල් 18,600.00 |
| සම්ප්‍රේශණ බලපත්‍ර | පෙර වසරේ කාර්ය බහුල ඉල්ලුම මෙගා වොට් 1ට හෝ ඉන් කොටසකට රුපියල් 11,500.00 බැගින් |
| බෙදාහැරීම් බලපත්‍ර | පෙර වසරේ මිනුම්ගත බලශක්තිය ගිගා වොට් පැය 1ට හෝ ඉන් කොටසකට රුපියල් 9,300.00 බැගින් |

EOG 02-0482

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.